44

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය
# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
# ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2014/15

**(පළම සෙමෙස්තරය)**

(පවත්වන ලද්දේ 2016 ඔක්තොම්බර්)

## BLE 303 - ශ්‍රම ආර්ථික විද්‍යාව

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. (i) පුද්ගලයෙකු කොපමණ ශ්‍රම පැය ප්‍රමාණයක් ශ්‍රම වෙළඳපලට සපයන්නේද යන්න තීරණය කරන ආකාරය ඔබ ඉගෙනගත් ආකෘතියක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

(ii) පහත සිදුවීම් ඇතිවීමට බලපා ඇති න්‍යායාත්මක හේතු පැහැදිලි කරන්න.

(අ). රාජ්‍ය අංශයේ සේවා නියුත්තිකයන්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් මූලික රැකියාවට අමතරව තවත් රැකියාවක නිරත වීම.

(ලකුණු 05)

(ආ). වතු අංශයේ ශ්‍රමිකයන්ගේ වැටුප් විශාල ලෙස ඉහල දැමීම ඇතැම් විට ශ්‍රම සැපයුම අඩුවීමට හේතුවිය හැක.

(ලකුණු 05)

02. (i) පූර්ණ තරගකාරී වෙළඳපලක සිටින ආයතනයක් කෙටි කාලයේදී උපරිම නිෂ්පාදනයක් ලබා ගැනීම සඳහා කොපමණ ශ්‍රමිකයන් ප්‍රමාණයක් සේවා නියුත්ත කළ යුතු ද යන්න තීරණය කරන ආකාරය ඔබ ඉගෙනගත් න්‍යායක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

(ii) යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකාවට එරෙහිව පනවා තිබූ අපනයන මත්ස්‍ය තහනම ඉවත් කිරීමට. ශ්‍රී ලංකාවේ ශ්‍රම ඉල්ලුම කෙරෙහි ඇති කරන බලපෑම පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iii). වතු අංශයේ ශ්‍රමිකයන්ගේ වැටුප් විශාල ප්‍රතිශතයකින් ඉහල දැමීම නිසා දිගුකාලයේදී, ශ්‍රම ඉල්ලුම මත ඇතිවිය හැකි බලපෑම් නිවවුම් ප්‍රතිවිපාකය හා ආදේශන ප්‍රතිවිපාකය ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

03. ශ්‍රී ලංකා පොලිස් සේවයේ සේවා නියුත්තිකයන්ගේ වැටුප් 17%කින් වැඩිකිරීමට රජය තීරණය කර ඇත.

(i) ප්‍රමුඛ අනුගාමික ගැටළුව පොලිස් සේවය තුළ ඇති වී ඇති ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ii) ඉහත ගැටළුව විසඳීම සඳහා වැටුප් ඉහල දැමීම කෙතෙක් දුරට සාර්ථක වන්නේද නැද්ද යන්න ඔබ ඉගෙන ගත් න්‍යායක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iii) පහත විකල්ප ගෙවීම් ක්‍රමවල ඇති වාසි සහ අවාසි දක්වන්න.

(අ). ශ්‍රමිකයන් නිෂ්පාදනය කරන භාණ්ඩ ඒකක ප්‍රමාණය මත ගෙවීම් කිරීම.

(ලකුණු 05)

(ආ). ලාභයෙන් කොටසක් ශ්‍රමිකයන් සඳහා ගෙවීම.

(ලකුණු 05)

(ඇ). ප්‍රසාද දීමනා ගෙවීම

(ලකුණු 05)

**04.** (i) ශ්‍රම වෙළඳපල තුළ දැකිය හැකි වැටුප් වෙනස්කම් (wage differentials) ඇතිවීමට බලපා ඇති ප්‍රධාන හේතූන් මොනවාද ?

(ලකුණු 10)

(ii) අසමානතා සමාන කිරීම (Compensating Diffentials) යන්නෙන් කුමක් අදහස් වේදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(iii) සාමාන්‍යයෙන් වෛද්‍යවරුන්ගේ වැටුප් හෙදියන්ගේ වැටුපට වඩා වැඩි වේ. මෙවැනි තත්වයක් සමතුලිතතාවයක් ලෙස පවතින්නේ කෙසේ ද යන්න පැහැදිළ කරන්න.

(ලකුණු 05)

**05.** (i) ශ්‍රම වෙළඳපල තුළ වෙනස්කම් කර සැලකීම (Labor market discrimination) යන්න උදාහරණ මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) ශ්‍රම වෙළඳපල තුළ වෙනස්කම් කර සැලකීම් ඇති වන්නේ සේව්‍යයන්ගේ හා සේවකයන්ගේ රුචිය මත (Employer and employee taste) මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(iii) සංඛ්‍යානමය වෙනස්කම් කිරීම (Statistical discrimination) යන්න උදාහරණ මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

**06.** (i) තොරතුරුවල අසමමිතිකතාවය යන සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ii) තොරතුරුවල අසමමිතිකතාවයන් වැඩ වර්ජන ඇතිවන ආකාරය තොරතුරුවල අසමමිතිකතා ගැටළුව ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(iii) චේම්බලේන්ගේ ආකෘතියට අනුව (Chanberlain Model) වෘත්තීය සමිතිවල හා කළමනාකාරිත්වයේ කේවල් කිරීමේ බලය තීරණය වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)